# පුරප්පාඩු

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## (ජල සම්පාදන අමාත්‍යාංශය)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## "විදුම් යන්ත්‍ර ක්‍රියාකරු (ආධුනික)" තනතුර

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ ගණිතය ඇතුළු විෂයයන් 06 කින් සමත්වීම සහ පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයක වසර 02 ආධුනික පුහුණුව හෝ ඒ සමාන පළපුරුද්ද.

| | | |
|---|---|---|
| **වැටුප** | : | 41,784/- + ජීවන වියදම් දීමනාව (මාසික) |
| **වැටුප් කාණ්ඩය** | : | **PL3** |
| **තෝරා ගැනීම** | : | සම්මුඛ පරීක්ෂණයක් මගිනි |
| **වයස් සීමාව** | : | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව බලනොපාන අතර, එම අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතුය. |
| **සැළකිය යුතුයි** | : | මෙම තනතුර සඳහා පුරප්පාඩු පවතිනුයේ උතුර, උතුරු මැද, නැගෙනහිර හා දකුණු පළාත්වල බැවින් තෝරා ගැනීමේදී එම පළාත්වල පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවයක් ලබාදෙනු ඇත. |

අයදුම්කරුවන් සිය ජීව දත්ත තොරතුරු සහ ඒවා සනාථ කිරීම සඳහා අදාළ සහතිකපත්වල ඡායා පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2021.02.14 දිනට හෝ ඊට ප්‍රථම අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, අංක 14, ගාලුපාර, රත්මලාන ලිපිනයට එවිය යුතුය. අදාළ සහතිකපත්වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද අයදුම්කරන තනතුරු නාමය කවරයේ වම්පස සඳහන් කරන්න.

**සාමානයාධිකාරී,**
**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.**

**තැ. පෙ. 14,**
**ගාලුපාර,**
**රත්මලාන.**